13 දශම

මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් ඔබට,
- දශම සංඛ්‍යා හඳුනා ගැනීමට,
- දශම සංඛ්‍යා සංසන්දනය කිරීමට සහ
- දශමස්ථාන දෙකක් සහිත දශම සංඛ්‍යා එකතු කිරීමට සහ අඩු කිරීමට,

හැකියාව ලැබේ.

13 .1 දශම හැඳින්වීම

1ක් සමාන කොටස් 10කට බෙදා, ලබා ගත් එක් කොටසක් $\frac{1}{10}$ක් බව, අපි භාග පාඩමේ දී ඉගෙන ගත්තෙමු.

තව ද 1ක් යනු $\frac{1}{10}$ ඒවා 10කි.



පාට කර ඇති කොටස $\frac{1}{10}$කි.

1

1 යනු $\frac{1}{10}$ ඒවා 10කි.

$\frac{1}{10}$ ලියන තවත් ආකාරයක් නම් 0.1 වේ. එනම්, $0.1 = \frac{1}{10}$

0.1 කියවනු ලබන්නේ බින්දුවයි දශම එක ලෙසිනි.

තව ද $\frac{2}{10}$ යනු $\frac{1}{10}$ ඒවා 2කි. එනම්, $0.2 = \frac{2}{10}$

0.2 කියවනු ලබන්නේ බින්දුවයි දශම දෙක ලෙසිනි.

මේ අනුව, $0.3 = \frac{3}{10}$, $0.4 = \frac{4}{10}$, $0.5 = \frac{5}{10}$, $0.6 = \frac{6}{10}$, $0.7 = \frac{7}{10}$, $0.8 = \frac{8}{10}$ සහ $0.9 = \frac{9}{10}$ වේ.

ස්ථානීය අගය පාඩමේ දී අපි සංඛ්‍යාවක එක් එක් ඉලක්කම පිහිටන ස්ථාන හඳුනා ගත්තෙමු. දැන් අපි 0.1, 0.2, 0.3, 0.4, 0.5, 0.6, 0.7, 0.8 සහ 0.9 යන සංඛ්‍යාවල එක් එක් ඉලක්කම පිහිටන ස්ථාන නම් කරමු.

මෙම සංඛ්‍යාවල 0 ලියා ඇති ස්ථානය එකස්ථානය වේ. 0ට පසුව ඇති තිත, **දශම තිත** ලෙස හැඳින්වේ. දශම තිතට පසු ව ඇති ඉලක්කම පිහිටන ස්ථානය **පළමු දශමස්ථානය** ලෙස හැඳින්වේ. පළමු දශමස්ථානයට අදාළ **ස්ථානීය අගය** $\frac{1}{10}$ වේ.

0.5 යන සංඛ්‍යාව සලකමු.

0.5හි එක් එක් ස්ථානය හතරැස් කොටුවකින් සලකුණු කොට, එක් එක් ඉලක්කම පිහිටන ස්ථානය පහත රූපයේ දක්වා ඇත.



2.5 යන සංඛ්‍යාව සලකමු.



$2.5 = 1$ ඒවා $2 + \frac{1}{10}$ ඒවා 5

$2.5 = 2 + 0.5$

2.5 යන සංඛ්‍යාව ගණක රාමුවකින් නිරූපණය කරමු.



2.5හි 2 පිහිටන ස්ථානය එකස්ථානය වේ. 2න් නිරූපණය වන අගය 1 ඒවා 2කි. එනම් 2කි.

2.5හි 5 පිහිටන ස්ථානය පළමු දශමස්ථානය වේ. 5න් නිරූපණය වන අගය $\frac{1}{10}$ ඒවා 5කි. එනම් $\frac{5}{10}$ හෙවත් 0.5කි.

13.1 අභ්‍යාසය

(1) පහත දැක්වෙන වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

සංඛ්‍යාව	වචනයෙන් ලියන ආකාරය
1.8	....
25.7	....
10.6	....
....	හැට නවයයි දශම හතර
18.2	....
....	තුන්සිය අනූ හයයි දශම හත

(2) පහත දැක්වෙන එක් එක් ගණක රාමුවෙන් නිරූපණය කර ඇති සංඛ්‍යාව ලියන්න.

(i)



(ii)



(iii)



(3) (a) පහත දැක්වෙන එක් එක් සංඛ්‍යාව ගණක රාමුවකින් නිරූපණය කරන්න.

(i) 0.7 (ii) 9.6 (iii) 9.9 (iv) 15.2

(b) ඉහත සංඛ්‍යාවල එක් එක් ඉලක්කමෙන් නිරූපණය වන අගය ලියන්න.

13.2 දශම හැඳින්වීම තවදුරටත්

1ක් සමාන කොටස් 100කට බෙදා, ලබාගත් එක් කොටසක් $\frac{1}{100}$ක් බව, අපි භාග පාඩමේ දී, ඉගෙන ගත්තෙමු.







$\frac{1}{100}$

$\frac{1}{10}$ යනු, $\frac{1}{100}$ ඒවා 10කි.

1 යනු $\frac{1}{10}$ ඒවා 10කි.

$\frac{1}{100}$, දශමස්ථාන භාවිත කරමින් ලියන්නේ 0.01 ලෙසිනි.

එනම්, $0.01 = \frac{1}{100}$

0.01 කියවනු ලබන්නේ **බින්දුවයි දශම බින්දුවයි එක** ලෙසිනි.

තව ද $\frac{4}{100}$ යනු $\frac{1}{100}$ ඒවා 4කි.

$\frac{4}{100}$ දශමස්ථාන භාවිත කරමින් ලියන්නේ 0.04 ලෙස යි.

0.04 කියවනු ලබන්නේ බින්දුවයි දශම බින්දුවයි හතර ලෙසිනි.

$\frac{27}{100}$ **සලකමු.**

$\frac{27}{100} = \frac{20}{100} + \frac{7}{100} = \frac{2}{10} + \frac{7}{100} = \frac{1}{10}$ ඒවා $2 + \frac{1}{100}$ ඒවා $7 = 0.2 + 0.07$

$\frac{27}{100}$ දශමස්ථාන භාවිත කරමින් ලියන්නේ, 0.27 ලෙසිනි.

0.27 කියවනු ලබන්නේ **බින්දුවයි දශම දෙකයි හත** ලෙසිනි.

0.27 ගණක රාමුවකින් නිරූපණය කරමු.



එසේම, $0.45 = \frac{45}{100}$ ද $0.67 = \frac{67}{100}$ ද වේ.

සංඛ්‍යාවක පළමු දශමස්ථානයට පසුව ඇති ඉලක්කම පිහිටන ස්ථානය **දෙවන දශමස්ථානය** ලෙස හඳුන්වයි. දෙවන දශමස්ථානයට අදාළ **ස්ථානීය අගය** $\frac{1}{100}$ වේ.

මෙතෙක් ඉගෙන ගත් කරුණු භාවිතයෙන්, දශමස්ථාන දෙකක් සහිත සංඛ්‍යාවක එක් එක් ඉලක්කමෙන් නිරූපණය වන අගය සොයා බලමු.

මේ සඳහා 19.67 යන සංඛ්‍යාව සලකමු.

එක් එක් ස්ථානය හතරැස් කොටුවකින් සලකුණු කොට, 19.67හි එක් එක් ඉලක්කමේ ස්ථාන පහත රූපයේ දක්වා ඇත.



19.67, ගණක රාමුවකින් නිරූපණය කරමු.



19.67හි 1 පිහිටන ස්ථානය දසස්ථානය වේ.
19.67හි 1න් නිරූපණය වන අගය $= 10 \times 1 = 10$

19.67හි 9 පිහිටන ස්ථානය එකස්ථානය වේ.
19.67හි 9න් නිරූපණය වන අගය $= 1 \times 9 = 9$

19.67හි 6 පිහිටන ස්ථානය පළමු දශමස්ථානය වේ.

19.67හි 6න් නිරූපණය වන අගය $= \frac{1}{10}$ ඒවා $6 = \frac{6}{10} = 0.6$

19.67හි 7 පිහිටන ස්ථානය දෙවන දශමස්ථානය වේ.

19.67හි 7න් නිරූපණය වන අගය $= \frac{1}{100}$ ඒවා $7 = \frac{7}{100} = 0.07$

දශම සංඛ්‍යාවක දශම තිතට වම්පසින් ඇති කොටස **පූර්ණ සංඛ්‍යා කොටස** ලෙස හඳුන්වයි. උදාහරණයක් ලෙස 19.67හි පූර්ණ සංඛ්‍යා කොටස 19 වේ.

නිදසුන 1

සංඛ්‍යාව	ඉලක්කම	එම ඉලක්කම පිහිටන ස්ථානය	එම ඉලක්කමෙන් නිරූපණය වන අගය
1.3	3	පළමු දශමස්ථානය	$\frac{1}{10}$ ඒවා 3 = $\frac{3}{10}$ = 0.3
1.28	8	දෙවන දශමස්ථානය	$\frac{1}{100}$ ඒවා 8 = $\frac{8}{100}$ = 0.08
14.65	4	එකස්ථානය	1 ඒවා 4 = 4
25.39	9	දෙවන දශමස්ථානය	$\frac{1}{100}$ ඒවා 9 = $\frac{9}{100}$ = 0.09
1991.06	0	පළමු දශමස්ථානය	$\frac{1}{10}$ ඒවා 0 = 0

ක්‍රියාකාරකම 1

(1) පහත දැක්වෙන එක් එක් සංඛ්‍යාව ගණක රාමුවක් මගින් නිරූපණය කරන්න.

(i) 0.21 (ii) 6.78 (iii) 9.99 (iv) 10.01 (v) 112.65

13.2 අභ්‍යාසය

(1) පහත දැක්වෙන එක් එක් භාගය, දශමස්ථාන භාවිත කරමින් ලියා දක්වන්න.

(i) $\frac{4}{10}$ (ii) $\frac{28}{100}$ (iii) $\frac{7}{10}$ (iv) $\frac{9}{100}$ (v) $\frac{30}{100}$ (vi) $\frac{8}{10}$

(2) පහත දැක්වෙන එක් එක් සංඛ්‍යාව අකුරින් ලියා දක්වන්න.

(i) 0.1 (ii) 0.52 (iii) 12.7 (iv) 18.3 (v) 8.99

(3) පහත දැක්වෙන එක් එක් ගණක රාමුවෙන් නිරූපණය කර ඇති සංඛ්‍යාව ලියා දක්වන්න.

(i)



(ii)



(iii)



(4) පහත අකුරින් දක්වා ඇති එක් එක් සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

(i) බින්දුවයි දශම දෙකයි එක
(ii) එකයි දශම එක
(iii) එකසිය දෙකයි දශම බිංදුවයි දෙක
(iv) දාහතයි දශම එකයි හත
(v) දහයයි දශම අටයි පහ

(5) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

සංඛ්‍යාව	ඉලක්කම	එම ඉලක්කම පිහිටන ස්ථානයේ නම	එම ඉලක්කමෙන් නිරූපණය වන අගය
2.73	2		
0.61	6		
21.17	7		
1.03	0		
2.0	0		
145.91	9		

13.3 දශම සංඛ්‍යා සංසන්දනය

දශම සංඛ්‍යා සංසන්දනය භාග ඇසුරෙන්

$\frac{1}{10} = 0.1$

$\frac{2}{10} = 0.2$

$\frac{1}{10}$ හා $\frac{2}{10}$ යන භාගවලින්, $\frac{1}{10} < \frac{2}{10}$ බව, අපි භාග පාඩමේ දී ඉගෙන ගත්තෙමු. එනම් 0.1, 0.2ට වඩා කුඩා වේ.

දැන් අපි 0.7 හා 0.5 සංඛ්‍යාවලින් වඩා විශාල සංඛ්‍යාව සොයමු.

$\frac{7}{10} = 0.7$ ද $\frac{5}{10} = 0.5$ ද වේ.

$\frac{7}{10} > \frac{5}{10}$ බැවින්, $0.7 > 0.5$

එම නිසා 0.7 හා 0.5 සංඛ්‍යාවලින් වඩා විශාල සංඛ්‍යාව වන්නේ 0.7 ය.

1 හා 0.8 සංසන්දනය කරමු.

$1 = \frac{10}{10}$ ද $0.8 = \frac{8}{10}$ ද වේ.

$\frac{10}{10} > \frac{8}{10}$ බැවින්, $1.0 > 0.8$

එනම්, 1, 0.8ට වඩා විශාල වේ.



2 හා 1.8 සංසන්දනය කරමු.

රූපය අනුව $2 > 1.8$ බව පැහැදිලි වේ.



දහයෙන් පංගු සංසන්දනය ඉගෙනගත් අපි දැන් සියයෙන් පංගු සංසන්දනය කරමු.

0.23 හා 0.52 සංසන්දනය කරමු.

$0.23 = \frac{23}{100}$ ද $0.52 = \frac{52}{100}$ ද වේ.

$\frac{23}{100} < \frac{52}{100}$ බැවින්, $0.23 < 0.52$ වේ. එනම්, 0.52, 0.23ට වඩා විශාල වේ.

0.3 හා 0.32 සංසන්දනය කරමු.

$0.3 = \frac{3}{10}$ ද $0.32 = \frac{32}{100}$ ද වේ.

$\frac{3}{10}$ හා $\frac{32}{100}$ සංසන්දනය කිරීමට, අපි මෙම භාග හරය සමාන වූ භාග බවට පත් කර ගනිමු.

$$\frac{3}{10} = \frac{3 \times 10}{10 \times 10} = \frac{30}{100}$$

එනම්, $\frac{30}{100}$, $\frac{3}{10}$ ට තුල්‍ය භාගයකි.

$\frac{30}{100} < \frac{32}{100}$ බැවින්, $0.30 < 0.32$

එනම්, $0.3 < 0.32$

● දශම සංඛ්‍යා සංසන්දනය සඳහා තවත් ක්‍රමයක්

දශම සංඛ්‍යාවක එක් එක් ඉලක්කමේ විශාලත්වය ඇසුරෙන් දශම සංඛ්‍යා සංසන්දනය කළ හැකි ය.

දශම සංඛ්‍යා දෙකක් සංසන්දනය කිරීමේ දී, විශාල පූර්ණ සංඛ්‍යා කොටස ඇති සංඛ්‍යාව වඩා විශාල සංඛ්‍යාව වේ. සංඛ්‍යා දෙකෙහි පූර්ණ සංඛ්‍යා කොටස් සමාන නම්, දශමස්ථානවල ඇති ඉලක්කම්වලට අනුව සංසන්දනය කළ යුතු ය.

එවිට සංඛ්‍යා දෙකෙහි පළමු දශමස්ථානයේ ඉලක්කම විශාල සංඛ්‍යාව වඩා විශාල සංඛ්‍යාව වේ. සංඛ්‍යා දෙකෙහි පළමු දශමස්ථානයේ ඉලක්කම් සමාන නම්, දෙවන දශමස්ථානයේ ඉලක්කම් සැලකිය යුතු ය. එවිට දෙවන දශමස්ථානයේ ඇති ඉලක්කම විශාල සංඛ්‍යාව වඩා විශාල සංඛ්‍යාව වේ.

නිදසුන 1

4.15, 3.76 හා 3.52 සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.

මෙම සංඛ්‍යා තුනෙහි පූර්ණ සංඛ්‍යා කොටස විශාලතම සංඛ්‍යාව වන්නේ 4.15 ය. එම නිසා, 4.15 විශාලතම සංඛ්‍යාව වේ.
දැන් අපි 3.76 හා 3.52 සංඛ්‍යා සලකමු.
3.76 හා 3.52 සංඛ්‍යා දෙකෙහි පූර්ණ සංඛ්‍යා කොටස් සමාන වේ.
එම නිසා එම සංඛ්‍යාවල පළමු දශමස්ථානයේ ඇති ඉලක්කම් සලකා බලමු.

3.76හි පළමු දශමස්ථානයේ ඉලක්කම 7 වේ.

3.52හි පළමු දශමස්ථානයේ ඉලක්කම 5 වේ.

මෙහි දී $7 > 5$ බැවින්, $3.76 > 3.52$

ඒ අනුව, ඉහත සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියූ විට 3.52, 3.76, 4.15 වේ.

නිදසුන 2

8.76 හා 8.72 යන සංඛ්‍යාවලින් වඩා විශාල සංඛ්‍යාව කුමක් ද?

8.76 හා 8.72හි පූර්ණ සංඛ්‍යා කොටස් සමාන වේ.
සංඛ්‍යා දෙකෙහි ම පළමු දශමස්ථානයේ ඉලක්කම් ද සමාන වේ.
දැන් අපි එම සංඛ්‍යා දෙකෙහි දෙවන දශමස්ථානයේ ඇති ඉලක්කම් සලකමු.
8.76හි දෙවන දශමස්ථානයේ ඉලක්කම 6 ද 8.72හි දෙවන දශමස්ථානයේ ඉලක්කම 2 ද වේ. මෙහි දී $6 > 2$ බැවින්, $8.76 > 8.72$
එම නිසා ඉහත සංඛ්‍යා දෙකෙන් වඩා විශාල සංඛ්‍යාව වන්නේ 8.76 වේ.

නිදසුන 3

0.3, 0.33, 0.03 සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.

$0.3 = 0.30$ ද බැවින්, 0.30, 0.33, 0.03 සංඛ්‍යා සලකමු.

- මෙම සංඛ්‍යා තුනෙහි ම පූර්ණ සංඛ්‍යා කොටස් සමාන වේ.
- පළමු දශමස්ථානයේ ඉලක්කම කුඩාතම වන්නේ 0.03හි ය. එම නිසා 0.03 කුඩාතම සංඛ්‍යාව වේ.
- 0.3 හා 0.33 සංඛ්‍යාවල පළමු දශමස්ථානයේ ඉලක්කම සමාන වේ. ඒවායේ දෙවන දශමස්ථානයේ ඉලක්කම විශාල වන්නේ 0.33හි ය.
- එම නිසා, $0.33 > 0.3$
- ඒ අනුව, ඉහත සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියූ විට 0.03, 0.3, 0.33 වේ.

13.3 අභ්‍යාසය

(1) පහත දැක්වෙන එක් එක් සංඛ්‍යා යුගලය අතුරින් වඩා විශාල සංඛ්‍යාව තෝරා ලියන්න.

(i) 0.1 හා 0.5 (ii) 0.06 හා 0.6
(iii) 2.35 හා 2.53 (iv) 3.05 හා 3.51
(v) 7.1 හා 7.09 (vi) 2.58 හා 5.21

(2) පහත දැක්වෙන එක් එක් දශම සංඛ්‍යා යුගලය සඳහා > හෝ < හෝ = හෝ සංකේතය නිවැරදිව යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) 0.05 .... 0.50 (ii) 0.7 .... 0.70
(iii) 2.81 .... 3.18 (iv) 4.04 .... 4.40
(v) 1.2 .... 1.20 (vi) 2.85 .... 2.82

(3) පහත සංඛ්‍යා ආරෝහණ පටිපාටියට සකස් කරන්න.

(i) 0.25, 0.5, 0.52, 2.05 (ii) 2.35, 3.78, 1.23, 4.35
(iii) 0.04, 4, 4.04, 0.44 (iv) 1.31, 1.33,3.13, 3.03

13.4 දශම සංඛ්‍යා එකතු කිරීම

0.3 හා 0.2 එකතු කරමු.



මෙම රූපය මගින් ඒකකයක් නිරූපණය කරන අතර, එය සමාන කොටස් දහයකට බෙදා ඇත.

මගින් $\frac{1}{10}$ක්, එනම් 0.1ක් නිරූපණය වේ.

 මගින් $\frac{2}{10}$ක්, එනම් 0.2ක් ද,

මගින් $\frac{3}{10}$ක්, එනම් 0.3ක් ද නිරූපණය කෙරේ.

ඒ අනුව,

$$\frac{2}{10} + \frac{3}{10} = \frac{5}{10}$$

$$0.2 + 0.3 = 0.5$$

0.2 + 0.3 පහත ආකාරයට ද ලියා එකතු කළ හැකි ය.

$$\begin{array}{r} 0.2 \\ +\ 0.3 \\ \hline 0.5 \\ \hline \end{array}$$

මෙහි දැක්වෙන පරිදි, සංඛ්‍යා දෙකෙහි එක් එක් ස්ථානයේ ඉලක්කම් එක ම තීරයේ පිහිටන සේත්, දශම තිත එක ම තීරයේ පිහිටන සේත්, සංඛ්‍යා ලියාගෙන ඒවායේ එක් එක් ස්ථානවල ඉලක්කම් වෙන වෙන ම එකතු කරමු.

$$\begin{array}{r} 2.57 \\ +\ 1.68 \\ \hline \\ \hline \end{array}$$ ඓක්‍යය සොයමු.

මෙම එකතු කිරීම පහත පියවරවල් මගින් පැහැදිලි කර ගනිමු.

	1 ඒවා		$\frac{1}{10}$ ඒවා	$\frac{1}{100}$ ඒවා
	2	.	$^{1}5$	7
+	1	.	6	8
				5
				15

පියවර 1 - $\frac{1}{100}$ ඒවා එකතු කරමු.

7 + 8 = 15

$\frac{1}{100}$ ඒවා 15 යනු, $\frac{10}{100}+\frac{5}{100}$, එනම් $\frac{1}{10}$ ඒවා 1ක් හා $\frac{1}{100}$ ඒවා 5කි.

$\frac{1}{100}$ ඒවා 5 දෙවන දශමස්ථානයේ 5 ඉලක්කමෙන් නිරූපණය කර, $\frac{1}{10}$ ඒවා 1 පළමු දශමස්ථානයට ගෙන යමු.

	1 ඒවා		$\frac{1}{10}$ ඒවා	$\frac{1}{100}$ ඒවා
	$^{1}2$	.	$^{1}5$	7
+	1	.	6	8
			2	5
			12	

පියවර 2 - $\frac{1}{10}$ ඒවා එකතු කරමු.

1 + 5 + 6 = 12

$\frac{1}{10}$ ඒවා 12 යනු 1 ඒවා 1ක් හා $\frac{1}{10}$ ඒවා 2කි.

$\frac{1}{10}$ ඒවා 2 පළමු දශමස්ථානයේ 2 ඉලක්කමෙන් නිරූපණය කර, එකේ ඒවා 1, එකස්ථානයට ගෙන යමු.

	1 ඒවා		$\frac{1}{10}$ ඒවා	$\frac{1}{100}$ ඒවා
	$^{1}2$	.	$^{1}5$	7
+	1	.	6	8
	4	.	2	5
			12	15

පියවර 3 -

තිත එක ම තීරයට සිටින සේ පිළිතුරෙහි ද ලියනු ලැබේ. දැන් එකේ ඒවා එකතු කරමු.

1 + 2 + 1 = 4

එනම් එකේ ඒවා 4කි. 4, එකස්ථාන තීරයේ ලියමු.

පිළිතුර 4.25 වේ.

5.7 හා 2.53 සංඛ්‍යා එකතු කරමු.

සංඛ්‍යා දෙකෙහි එක් එක් ස්ථානයේ ඉලක්කම්, එක ම තීරයේ සිටින සේ ලියා එකතු කරමු. 2.53හි දෙවන දශමස්ථානයේ ඉලක්කමක් ඇති නිසා 5.7, 5.70 ලෙස ලියා ගෙන එකතු කරමු.

$$\begin{array}{r} 5.70 \\ +\,2.53 \\ \hline 8.23 \\ \hline \hline \end{array}$$

13.4 අභ්‍යාසය

(1) අගය සොයන්න.

(i) $\begin{array}{r} 0.1 \\ +\,0.3 \\ \hline \\ \hline \hline \end{array}$ (ii) $\begin{array}{r} 0.71 \\ +\,0.23 \\ \hline \\ \hline \hline \end{array}$ (iii) $\begin{array}{r} 2.71 \\ +\,5.16 \\ \hline \\ \hline \hline \end{array}$ (iv) $\begin{array}{r} 5.32 \\ +\,1.83 \\ \hline \\ \hline \hline \end{array}$ (v) $\begin{array}{r} 2.7 \\ +\,3.85 \\ \hline \\ \hline \hline \end{array}$

(vi) $\begin{array}{r} 1.8 \\ +\,0.2 \\ \hline \\ \hline \hline \end{array}$ (vii) $\begin{array}{r} 18.35 \\ +\,35.26 \\ \hline \\ \hline \hline \end{array}$ (viii) $\begin{array}{r} 1.28 \\ +\,3.84 \\ \hline \\ \hline \hline \end{array}$ (ix) $\begin{array}{r} 3.88 \\ +\,9.52 \\ \hline \\ \hline \hline \end{array}$ (x) $\begin{array}{r} 5.96 \\ +\,4.04 \\ \hline \\ \hline \hline \end{array}$

(2) නිවසක ගිය මාසයේ මුල් සති දෙක තුළ විදුලි පරිභෝජනය ඒකක 45.7ක් විය. එහි අවසන් සති දෙක තුළ විදුලි පරිභෝජනය ඒකක 50.3ක් විය. ගිය මාසයේ පරිභෝජනය කළ මුළු විදුලි ඒකක ප්‍රමාණය කොපමණ ද?

13.5 දශම සංඛ්‍යා අඩු කිරීම

0.7 - 0.3 හි අගය සොයමු.

සංඛ්‍යා දෙකෙහි එක් එක් ස්ථානයේ ඉලක්කම්, එක ම තීරයේ පිහිටන සේත් දශම තිත එක ම තීරයේ පිහිටන සේත් සංඛ්‍යා ලියාගෙන අඩු කරමු.

$$\begin{array}{r} 0.7 \\ -\,0.3 \\ \hline 0.4 \\ \hline \hline \end{array}$$

3.65 – 1.98 අගය සොයමු.

මෙම අඩු කිරීම පහත පියවරවල් මගින් පැහැදිලි කර ගනිමු.

1 ඒවා		$\frac{1}{10}$ ඒවා	$\frac{1}{100}$ ඒවා
3	.	$^{5}6$	$^{15}5$
− 1	.	9	8
			7

පියවර 1 - $\frac{1}{100}$ ඒවා අඩු කරමු.

5, 8 ට වඩා කුඩා වේ.

$\frac{1}{10}$ ඒවා 1ක් දෙවන දශමස්ථානයට ගෙන එමු.

එවිට පළමු දශමස්ථානයේ $\frac{1}{10}$ ඒවා 5ක් ඉතිරි වේ.

$\frac{1}{10}$ ඒවා 1ක් යනු $\frac{1}{100}$ ඒවා 10කි.

$10 + 5 = 15$ එනම්, දෙවන දශමස්ථානයේ $\frac{1}{100}$ ඒවා 15 කි.

$\frac{1}{100}$ ඒවා 15න් $\frac{1}{100}$ ඒවා 8ක් අඩු කළ විට, $\frac{1}{100}$ ඒවා 7කි.

$\frac{1}{100}$ ඒවා 7, දෙවන දශමස්ථානයේ 7 ඉලක්කමෙන් නිරූපණය කරමු.

1 ඒවා		$\frac{1}{10}$ ඒවා	$\frac{1}{100}$ ඒවා
$^{2}3$	.	$^{\not 5}6$	$^{15}5$
− 1	.	9	8
	.	6	7

පියවර 2 - $\frac{1}{10}$ ඒවා අඩු කරමු.

$\frac{1}{100}$ ඒවා 7, දෙවන දශමස්ථානයේ 7 ඉලක්කමෙන් නිරූපණය කරමු.

5, 9 ට වඩා කුඩා වේ.

එකේ ඒවා 3න් 1ක් පළමු දශමස්ථානයට ගෙන එමු. එවිට එකේ ඒවා 2ක් එකස්ථාන තීරුවේ ඉතිරි වේ.

1 යනු, $\frac{1}{10}$ ඒවා 10කි.

එවිට පළමු දශමස්ථානයේ $\frac{1}{10}$ ඒවා 15කි.

$\frac{1}{10}$ ඒවා 15න් $\frac{1}{10}$ ඒවා 9ක් අඩු කළ විට $\frac{1}{10}$ ඒවා 6කි.

$\frac{1}{10}$ ඒවා 6, පළමු දශමස්ථානයේ 6 ඉලක්කමින් නිරූපණය කරමු.

1 ඒවා		$\frac{1}{10}$ ඒවා	$\frac{1}{100}$ ඒවා
$^{2}3$	.	$^{\not 5}6$	$^{15}5$
− 1	.	9	8
1	.	6	7

පියවර 3 -

දශම තිත එක ම තීරයකට සිටින සේ පිළිතුරෙහි ද ලියනු ලැබේ.

දැන් එකේ ඒවා අඩු කරමු.

$2 - 1 = 1$

1 එකස්ථාන තීරයේ ලියමු.

පිළිතුර 1.67 වේ.

නිදසුන 1

12.7 – 8.53 අගය සොයන්න.

$$\begin{array}{r} 12.70 \\ -\ 8.53 \\ \hline 4.17 \\ \hline\hline \end{array}$$

එක් එක් ස්ථානයේ ඉලක්කම් එක ම තීරයේ සිටින සේ ලියා අඩු කරමු. 12.7, 12.70 ලෙස ලියා ගත් විට සංඛ්‍යා දෙකේ ම දශමස්ථාන ගණන සමාන වේ.

13.5 අභ්‍යාසය

(1) අගය සොයන්න.

(i) $\begin{array}{r} 0.9 \\ -\ 0.5 \\ \hline \end{array}$ (ii) $\begin{array}{r} 3.6 \\ -\ 2.5 \\ \hline \end{array}$ (iii) $\begin{array}{r} 2.3 \\ -\ 1.7 \\ \hline \end{array}$ (iv) $\begin{array}{r} 8.39 \\ -\ 2.21 \\ \hline \end{array}$ (v) $\begin{array}{r} 2.85 \\ -1.08 \\ \hline \end{array}$

(vi) $\begin{array}{r} 15.08 \\ -\ 1.79 \\ \hline \end{array}$ (vii) $\begin{array}{r} 15.08 \\ -\ 0.84 \\ \hline \end{array}$ (viii) $\begin{array}{r} 7.22 \\ -\ 5.34 \\ \hline \end{array}$ (ix) $\begin{array}{r} 80.01 \\ -19.99 \\ \hline \end{array}$ (x) $\begin{array}{r} 2.08 \\ -1.99 \\ \hline \end{array}$

(2) පියා විසින් සිය පුතුන් දෙදෙනා වන නිමල් හා සුනිල් වෙත සිය ඉඩමෙන් 0.75ක ප්‍රමාණයක් පවරා දුන්නේ ය. නිමල්ට ලැබුණු ප්‍රමාණය ඉඩමෙන් 0.48ක් නම්, සුනිල්ට ලැබුණු ප්‍රමාණය ඉඩමෙන් කොපමණ ප්‍රමාණයක් ද?

(3) ජල විදුලි බලාගාරයක් ආශ්‍රිත ජලාශයක පිරවිය හැකි මුළු ජල ප්‍රමාණයෙන් 0.7ක් පමණ අඩංගු අවස්ථාවක මුළු ජල ප්‍රමාණයෙන් 0.15ක ප්‍රමාණයක් විදුලි නිෂ්පාදනයට යොදා ගැනිණි. දැන් ජලාශයේ ඉතිරි ජල ප්‍රමාණය, කොපමණ ද?

සාරාංශය

- දශම සංඛ්‍යාවක, දශම තිතට පසුව ඇති ස්ථානය පළමු දශමස්ථානය ලෙසත්, ඊළඟට ඇති ස්ථානය දෙවන දශමස්ථානය ලෙසත් හැඳින්වේ.
- දශම සංඛ්‍යා සංසන්දනයේ දී, දශම සංඛ්‍යා භාග සංඛ්‍යා ලෙස ලිවීමෙන් හෝ දශම සංඛ්‍යාවල එක් එක් ස්ථානයට අදාළ ඉලක්කමේ විශාලත්වය සැලකීමෙන් හෝ සංසන්දනය කළ හැකි ය.
- දශම සංඛ්‍යා එකතු කිරීමේ දී හා අඩු කිරීමේ දී එම සංඛ්‍යාවල එක් එක් ස්ථානයෙහි ඉලක්කම්වල නිරූපණය වන අගය සලකමින් ගණිත කර්මය සිදු කළ යුතු වේ.